# මහජන බැංකුවේ ට්‍රාන්සිට් කාඩ් අයදුම්පත

ශාඛාව

කාඩ් අංකය

ගිණුම් අංකය (තිබේ නම්)

: කොන්දොස්තර කාඩ්පත ☐ කරුණාකර ✓ සළකුණ යොදන්න

: මගී කාඩ්පත ☐ කරුණාකර ✓ සළකුණ යොදන්න

: කේවයිසී (KYC) ☐ කරුණාකර ✓ සළකුණ යොදන්න

: කේවයිසී නොමැති නම් (NON-KYC) ☐ කරුණාකර ✓ සළකුණ යොදන්න

ප්‍රිය මහත්මයාණෙනී/මහත්මියනී
මම ට්‍රාන්සිට් කාඩ්පතක් අයදුම් කිරීමට අපේක්ෂා කරන අතර, මාගේ විස්තර සදහන් අයදුම්පත අනුගාමී කටයුතු සදහා ඔබ වෙත ඉදිරිපත් කරමි.

1. පුද්ගලභාවය : පූජ්‍ය/ වෛද්‍ය/ මහතා/ මහත්මිය/ මෙනවිය
2. සම්පූර්ණ නම : ..............................................................................................................................
3. ජාතික හැදුනුම්පත් අංකය
2. තැපැල් ලිපින: ලිපිනය
   1. ..............................................................................................................................
   2. ..............................................................................................................................
   3. ..............................................................................................................................
   4. ..............................................................................................................................
3. දුරකථන අංක : නිවස...................................... කාර්යාලීය.................................. ජංගම.................................
4. විද්‍යුත් තැපැල්: ලිපිනය : ..............................................................................................................................
7. විවාහයට පෙර මවගේ නම (ආරක්ෂක හේතූන් සදහා) : ..............................................................................................................................
8. උපන් දිනය

| දිනය | | මාසය | | | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

| | | |
|---|---|---|
| එක් ගණුදෙනුවක් සදහා සීමාව | | රු.4,000/- |
| තැන්පත් කළ යුතු උපරිම සීමාව | : කොන්දොස්තර කාඩ්පත | රු.50,000/- |
| තැන්පත් කළ යුතු උපරිම සීමාව | : මගී කාඩ්පත | රු.10,000/- |

ඉහත පරිදි ලබා දී ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මම මෙයින් සහතික කරමි. පසුපිටෙහි සවිස්තරාත්මකව දක්වා ඇති පරිදි ගෙවීම් කිරීම්/මුදල් තැන්පත් කිරීම් කාඩ්පත් (SPEND/TOP UP CARDS) නිකුත් කිරීම පාලනය කෙරෙන නියමයන් සහ කොන්දේසි මම කියවා බලා තේරුම් ගන්නා ලද බවත්, මම තවදුරටත් තහවුරු කරමි. ඒවාට සහ බැංකුව විසින් පසුව ඕනෑම වේලාවක සිදුකරනු ලබන සංශෝධනයන්, විචලනයන් හෝ වෙනස් කිරීම් හා බැදී සිටීමට මම මෙයින් එකගවෙමි.
මෙයට විශ්වාසී

............................................................

අත්සන

**කාරුණික අවධානයට**

ට්‍රාන්ස්සිට් කාඩ්පත් සදහා සම්බන්ධවීමේ ගාස්තුව රු.250/- ක් වන අතර LANKA PAY/JCB කාඩ්පත (ට්‍රාන්සිට් කාඩ්පත හා හර කාඩ්පත) සදහා සම්බන්ධවීමේ ගාස්තුව රු.300/-කි. සෑම නව නිකුතුවක් සදහාම ගාස්තුවක් අදාළ වනවා ඇත. (මෙය කලින් කලට වෙනස් කෙරේ)

කාඩ්පත නිරුපද්‍රිතව ලද බව මම තහවුරු කරමි ............................................................

අත්සන සහ දිනය

**ශාඛාවේ ප්‍රයෝජනය සදහා පමණි** - බලයලත් නිළධාරී විසින් කෙරෙන ප්‍රකාශය

අත්සන සත්‍යාපනය කරන ලද අතර, ගාස්තු අයකර ගන්නා ලදී. මෙහෙයුම් උපදෙස් මැන්ඩේට් පත හා අනුකූල වේ.

............................................................ ............................................................

(බලයලත් නිළධාරී) දිනය

............................................................ ............................................................

(කළමනාකාර) දිනය

# නියමයන් සහ කොන්දේසි

මාගේ ඉල්ලීම හා අනුගාමීව මහජන බැංකුව (බැංකුව ) සැලකිල්ලට ගැනීම අනුව, මා වෙත මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර(CDM) පහසුකම් සහ, මා වෙත ට්‍රාන්ස්සිට් කාඩ්පතක් (TRANSIT CARD) නිකුත් කිරීම සලසා දීම අනුව පහත සදහන් නියමයන් සහ කොන්දේසි මගින් බැදී සිටීමට මම එකග වෙමි.

1. සෑම කල්හීම කාඩ්පත බැංකුවේ දේපළක් වශයෙන් සැලකීමටත් බැංකුව ඉල්ලා සිටි අවස්ථාවක කොන්දේසි විරහිතව සහ වෙන්කර තැබීමකින් තොරව එය ආපසු බාර දීමටත්,
2. ගණුදෙනුව ආවරණය කිරීම සදහා කාඩ් පතෙහි ප්‍රමාණවත් අරමුදල් ඇත්නම් මිසක කාඩ්පත භාවිතා කිරීම හෝ භාවිතා කිරීමට උත්සාහ කිරීම හෝ, කිසිම විටෙක සිදු නොකිරීම.
3. කාඩ්පත පැවරිය නොහැකි වන හෙයින්, පසු පිටෙහි නම් කරනු ලැබ ඇති තැනැත්තා විසින්ම පමණක් කාඩ්පත භාවිතය සීමා කිරීම.
4. බැංකුව විසින් හෝ බැංකුව වෙනුවෙන් කටයුතු කරනු ලබන වෙනත් කිසියම් පුද්ගලයෙක් විසින් හෝ, කාඩ්පත අවලංගු කිරීම පිළිබදව හෝ කාඩ්පත ආපසු ලබාගැනීම පිළිබදව මා වෙත දැනුම් දීමක් සිදුකිරීමෙන් පසුව, කාඩ්පත භාවිතා කිරීම හෝ භාවිතා කිරීමට උත්සාහ කිරීම හෝ නොකිරීම.
5. බැංකුවේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක (ATM) හෝ කාඩ්පත පිළිගනු ලබන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්රයක කාඩ්පත භාවිතා කිරීම සදහා පහසුව සලසමින් වෙන්කරනු ලැබ ඇති පුද්ගල හැදුනුම් අංකය (PIN NUMBER) කිසිම විටක හෝ කුමන තත්ත්වයක් යටතේ හෝ වෙනත් තැනැත්තෙක් වෙත අනාවරණැය නොකිරීම.
6. කාඩ්පතක අඩංගු හර කාඩ්පත අවලංගු කිරීම සදහා කාඩ්පතක නැතිවීම හෝ සොරාගැනීම බැංකුව වෙත වහාම දැනුම් දිය යුතුය. නැතිවූ හෝ සොරාගත් සියලම ට්‍රාන්සිට් කාඩ්පත්වල ශේෂයන් හුදෙක් ආපසු ගෙවීමට හෝ මාරුකිරීමට බැංකුවට නොහැකිය. නැතිවූ /සොරාගත් ට්‍රාන්ස්සිට් කාඩ්පතක්, නැතිවූ /සොරාගත් මුදල් පසුම්බියක් හා සර්වසම වේ.
7. නැතිවූ හෝ සොරාගත් හෝ කාඩ්පත් වලින් පැන නැගෙන මාර්ග අපගත ගණුදෙනු අදාලව, කාඩ්පත් මට්ටමින් පවත්වාගෙන යනු ලබන ඉතිරි ශේෂයන් සම්බන්ධයෙන් බැංකුව කුමන හෝ වගකීමක් භාර නොගනී
8. කාඩ්පත නැතිවීම, සොරාගැනීම, හෝ සැක කරන ලද අනිසි භාවිතය අදාල වන කල්හි, බැංකුව වෙත වගකීමක් නොපවතී. ට්‍රාන්සිට් කාඩ්පත සොරාගැනීම, අනිසි භාවිතය, වංචනික භාවිතය වයනය ආදිය හේතුවෙන් සිදුවන කිසියම් අලාභයකට බැංකුව වගකීමට පත් නොවෙයි.සෑම විටකම ඔවුන්ගේ ට්‍රාන්සිට් කාඩ්පත තමා භාරයේ සුරක්ෂිතව තබාගත යුතු යැයි ගනුදෙනුකරුවන්ට නිර්දේශ කෙරෙයි.කුමන හෝ මගී ආරවුලකදී, සෑමවිටකම අදාල ප්‍රවාහන බලධාරීන් හෝ ඔවුන්ගේ නියෝජිතායතනයන් සමග අයදුම්කරු විසදාගත යුතුය.
9. තවද කිසියම් අලාභයක්, සොරාගත් හෝ අනිසි භාවිතය පිළිබද සැක කරන ලද හෝ කාඩ්පත් සදහා, මාර්ගගත කාඩ්පත් ගිණුමෙහි පවත්නා යලිත් තැන්පත් කල මුදල් (TOP-UP MONEY) මාරුකිරීමට හෝ ආපසු ගෙවීමට හෝ බැOකුවට නොහැකිය.
10. ට්‍රාන්සිට් කාඩ්පත් ගණුදෙනු මාර්ග අපගත වන හෙයින් හා ගණුදෙනු සොයාගැනීමට අපහසු හෙයින් ට්‍රාන්සිට් කාඩ්පතක් නැතිවූ කල්හි පවත්නා ශේෂය මත ට්‍රාන්සිට් කාඩ්පත බැංකුවට නැවත නිකුත් කළ නොහැක. ඒ වෙනුවට අලුත් ට්‍රාන්සිට් කාඩ්පතක් ඉල්ලා සිටීමට අවශ්‍ය වේ.
11. කාඩ්පතක හානියක් සිදුවී ඇති කල්හි, සියලුම මාර්ග අපගත ගණුදෙනු ලැබීමෙන් පසුව දින 14 ක් ඇතුලත නව ට්‍රාන්සිට් කාඩ්පතක් බැංකුව නැවත නිකුත් කරයි. නව කාඩ්පතක් නිකුත් කිරීම සදහා හානියක් සිදුව ඇති කාඩ්පත භෞතිකව බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය
12. සියලු කල්හි ට්‍රාන්සිට් කාඩ්පත වෙතින් /කාඩ්පතේ ට්‍රාන්සිට් කාඩ් කොටස වෙතින්, උත්පාදනය වන සියලුම මගී/මාර්ග අපගත ගණුදෙනු සම්බන්ධයෙන් මම වගකීම භාරගනිමි.
13. ඉහත (9) ට යටත්ව, ආපසු ගැනීම් සහ/හෝ මාරුකිරීම් පිළිබද බැංකුවේ වාර්තා සියලුම අවශ්‍යතාවයන් සදහා තීරණාත්මක සහ බැදීම් සහගත වන බව පිළිගැනීමට සහ, මාගේ දැනීම සහ අධිකාරිය ඇතිව හෝ නොමැතිව ආපසු ගන්නා ලද හෝ මාරු කරන ලද සියලුම මුදල් මාගේ ගිණුමට හර කිරීම සදහා බැංකුවට බලය පැවරීමට,
14. කාඩ්පත භාවිතා කිරීමට පෙර මහජන බැංකුවේ මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍රය (CDM) මගින් ට්‍රාන්සිට් කාඩ්පතට ලංකා රුපියල්10,000/- දක්වා (මගී කාඩ්පත් සදහා) හෝ ලංකා රුපියල් 50,000/- දක්වා (කන්ඩක්ටර් කාඩ්පත් සදහා) මුදල් තැන්පත් කිරීමට (TO TOP UP) බැංකුව අවසර ලබා දේ.
15. මුදල් තැන්පත් කිරීමේ යන්තයේ තිරයෙහි (CDM SCREEN) දිස්වන හෝ මුද්‍රිත තැන්පතු පත්‍රිකාවේ (PRINTED DEPOSIT SLIP) හෝ ලැබීමේ නිවේදනයේ (RECEIPT ADVICE) සදහන් මුදල පිළිගනු ලැබීම, කවර අවශ්‍යතාවයක් සදහා හෝ බැංකුව සමග පවත්නා මගේ ගිණුමේ තීරණාත්මක තත්වය යැයි පිළිගනු නොලැබේ.
16. කාඩ්පත හෝ මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍රය (CDM) හෝ කිසියම් අයුරකින් නිසිලෙස ක්‍රියාත්මක නොවීම, හෝ අකර්මණ්‍යවීම හෝ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයේ (ATM) මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් උද්ගත වන කවර ආකාරයක හෝ අලාභයක්, හානියක් සදහා බැංකුව කුමන ආකාරයකින් හෝ බැදීමක් ඇතිකර ගන්නේ යැයි, වගකිව යුතු වන්නේ යැයි සලකනු නොලැබීමට
17. ඉහත (12) ප්‍රතිපාදනයෙහි පොදු නියාමනය කෙරෙහි තැකීමකින් තොරව සහ පක්ෂපාතීත්වයක් නොමැතිව, කාඩ්පත භාවිතයෙන් උද්ගත වන සහ කාඩ්පතට අනුශාංගික අවධානම් සමහරක් හෝ සියල්ල මගේම එකලා අවධානම මත සිදුවන බව මම උපකල්පනය කරමි.
18. කුමන හේතුවක් නිසාවෙන්වත් කාඩ්පතක් ගරු නොකිරීම හේතුවෙන් බැංකුව වගකීමට පත්නොවෙයි.
19. කිසියම් ගණුදෙනු ආරවුල්/මගී අවශ්‍යතා සදහා ට්‍රාන්ස්සිට් කාඩ්පත භාවිතය මත උද්ගත වන දුක්ගැනිවිලි සම්බන්ධයෙන්, බැංකුව බැදීමට පත්වන්නේ නැත, අදාල ට්‍රාන්සිට් කාඩ්පත්ලාභියාගේ ගමන සම්බන්ධයෙන් වන කිසියම් ආරවුලක්/ දුක්ගැනවිල්ලක්,අදාල ප්‍රවාහන බලධාරී හෝ ඔවුන්ගේ නියෝජිතායතනය සමග විසදාගනු ලබනවා ඇත.
20. ආරවුල් මෙහෙයවීම, ඉහත(18) ට යටත්ව අදාල ප්‍රවාහන බලධාරී හෝ ඔවුන්ගේ නියෝජිතායතන විසින් සිදුකරනු ලබනවා ඇත.
21. මෙම ලේඛණයෙහි කරුණු සම්බන්ධයෙන් හෝ මෙහි කිසියම් ප්‍රතිපාදනයක් සම්බන්ධයෙන් සැලකිල්ලක් දක්වන පාර්ශවයක් අතර කවර ආකාරයක හෝ ආරවුල් හෝ විෂමතාවක් හෝ උද්ගත වන කල්හි, ආරාවුල හෝ විෂමතාවන් මිත්‍රශීලීව විසදාගැනීමට, ඇතුලත් වන පාර්ශවයන් විසින් ඉතාම හොද ප්‍රයත්නයන් ගත යුතුය.
22. මා වෙත දැනුම් දීමක් නොමැතිව, කාඩ්පත අවලංගු කිරීමෙන් හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ ඕනෑම අවස්ථාවක මෙම පහසුකම අවසන් කිරීමේ ස්වාධීනත්වය බැංකුව වෙත පවතී.
23. සියලුම ට්‍රාන්සිට් කාඩ්පත් ගණුදෙනු ශ්‍රී ලංකා රුපියල් මගින් ක්‍රියාත්මක කෙරේ.
24. ලංකා රුපියල් මගින් මාර්ග අපගත ස්ථානීය ගෙවීම් සිදුකිරීමට පමණක් ට්‍රාන්සිට් කාඩ්පත භාවිතා කළ යුතුය.
25. තැන්පතුවක් සිදුකරනු ලබන අවස්ථාවකදී මුදල් තැන්පතු යන්ත්‍රය (CDM) විසින් නිකුත් කරනු ලබන ප්‍රකාශනය, මම අදහස්කොට තැන්පත් කරණ ලද ප්‍රමාණය නියෝජනය කිරීම පමණක් සිදුකරන අතර, බැංකුව කෙරෙහි කිසියම් බැදීමක් ඇති නොකරයි.
26. කාඩ්පත භාවිතය සම්බන්ධයෙන් බැංකුව විසින් පනවනු ලැබ ඇති නියාමනයන් සහ කොන්දේසි හැරෙන්නට කාඩ්පත භාවිතය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ජේසීබී ඉන්ටර්නැෂනල් (ජපානය) (JCB INTERNATIONAL - JAPAN) සහ ලංකා ක්ලියර් සමාගම (LANKA CLEAR (PVT) LIMITED) විසින් පනවනු ලැබ ඇති නියමයන් සහ කොන්දේසි පිළිපදිනු ලැබීමට කාඩ්පත්හිමියා බැදී සිටී.
27. මෙම ලේඛනය හෝ මෙහි ඕනෑම ප්‍රතිපාදනයක් ශ්‍රී ලංකාවේ නීතීන් අනුව පාලනය වේ.
28. අනෙකුත් වගකීම් සම්බන්ධ වන කල්හි, අදාල වන පරිද්දෙන් අනාගතයේදී ගාස්තු එකතු කරනු ලැබේ.
29. මහජන බැංකුවේ මුදල් තැන්පතු යන්ත්‍ර (CDM MACHINES) භාවිතා කරමින් මුදල් තැන්පත් සිදුකිරීම (TOP UP CASH) සහ ට්‍රාන්ස්සිට් පොස් යන්ත්‍ර (TRANSIT POS) (මාර්ග අපගත) හරහා ලංකා රුපියල් ගණුදෙනු සිදුකිරීම පමණක් ට්‍රාන්ස්සිට් කාඩ්පත්හිමියනට (CARD HOLDERS) අදාල වේ.
30. මෙම නියමයන් සහ කොන්දේසි වෙනස් කිරීමේ අයිතිය බැංකුව වෙත රදවාගනු ලැබේ.

……………………………………………………

කාඩ්පත්හිමියාගේ අත්සන